සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2017 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2017 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2017

ඉස්ලාම් ශිෂ්ටාචාරය I
இஸ்லாமிய நாகரிகம் I
Islamic Civilization I

**47 S I**

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
*Two hours*

**උපදෙස්:**

* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ **විභාග අංකය** ලියන්න.
* උත්තර පත්‍රයේ පසුපිටේ දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
* **1** සිට **50** තෙක් එක් එක් ප්‍රශ්නයට දී ඇති (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන හෝ** පිළිතුර තෝරාගෙන, එය **උත්තර පත්‍රයේ පසුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක් (X) යොදා දක්වන්න.**

**1.** පහත සඳහන් ඒවායින් වඩාත් නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) සුප්‍රසිද්ධ මස්හබ් හතරෙන් පළමුව බිහි වූයේ හනෆි මස්හබ් වේ.
(2) ශ්‍රී ලංකා මුස්ලිම් පෞද්ගලික නීතිය හඳුන්වා දෙන ලද්දේ ඉංග්‍රීසින්ගේ කාලයේ දී ය.
(3) ආණ්ඩුකාර මූසා බින් නුසයිර්ගේ මගපෙන්වීම යටතේ මුහම්මද් බින් කාසිම් ඉන්දියාව අත්පත් කර ගත්තේ ය.
(4) අබ්බාසීය යුගයේ දී අරාබි භාෂාව රාජ්‍ය භාෂාව ලෙස ප්‍රකාශයට පත් කෙරිණි.
(5) ඉමාම් බුහාරි (රහ්) හා ඉමාම් මුස්ලිම් (රහ්) විසින් දක්වන ලද හදීස් 'තබකාත්' ලෙස හැඳින්වේ.

**2.** ඉන්දියාවේ ඉස්ලාම් ව්‍යාප්තියට ඉමහත් දායකත්වයක් ලබා දීම නිසා 'සුල්තානුල් හින්ද්' යන ගෞරව නාමයෙන් ප්‍රශංසාවට ලක් වූයේ,
(1) ෂේක් අබ්දුල් කාදිර් ජීලානි (රහ්) තුමා ය.
(2) ෂේක් හාජා මොහිදීන් ජිස්ති (රහ්) තුමා ය.
(3) ඖරංගුසීබ් රජු ය.
(4) ඉමාම් ෂාහ්වලියුල්ලාහ් (රහ්) තුමා ය.
(5) ෂේක් නිලාමුද්දීන් ය.

**3.** සිංහල රජතුමකු වෙනුවෙන් තම ජීවිතය පරිත්‍යාග කිරීම නිසා 'මා රැක ලේ' යනුවෙන් රජතුමාගේ ප්‍රසංශාවට ලක් වූ මුස්ලිම් කාන්තාව ජීවත් වූ ප්‍රදේශය කුමක් ද?
(1) තැන්නේකුඹුර
(2) පඟරගම්මන
(3) කඩුගන්නාව
(4) දන්තුරේ
(5) කහටපිටිය

**4.** ඉමාම් මාලික් (රහ්) තුමා විසින් ලියන ලද ග්‍රන්ථය කුමක් ද?
(1) ෆික්හුල් අක්බර්
(2) දාදුල් මආද්
(3) අල්-මුඅත්තා
(4) ෆික්හුස් සුන්නා
(5) මින්හාජුත් තාලිබීන්

**5.** වෛද්‍ය විශාරද අලි බින් සීනා විසින් රචනා කරන ලද ග්‍රන්ථයක් **නොවන්නේ** කුමක් ද?
(1) කානූනුන් ෆිත්තිබ්බි
(2) අල්-හාවී
(3) කිතාබුශ් ශිෆා
(4) අදවියතුල් කාලිබා
(5) හුදූද් අත්-තිබ්බි

**6.** පහත සඳහන් අයගෙන් මදීනා හිජ්රතයට සම්බන්ධ **නොවූ** අයකු වන්නේ,
(1) අබූබක්ර් (රළි) ය.
(2) අස්මා බින්ත් අබීබක්ර් (රළි) ය.
(3) අබ්දුල්ලාහ් බින් උරයිකත් ය.
(4) සඅද් බින් මආද් (රළි) ය.
(5) ආමිර් බින් ෆුහයිරා ය.

**7.** ස්පාඤ්ඤයේ මුස්ලිම් රාජ්‍ය පාලනය පැවතියේ,
(1) ක්‍රි. ව. 661 සිට ක්‍රි. ව. 750 දක්වා ය.
(2) ක්‍රි. ව. 750 සිට ක්‍රි. ව. 1258 දක්වා ය.
(3) ක්‍රි. ව. 756 සිට ක්‍රි. ව. 1492 දක්වා ය.
(4) ක්‍රි. ව. 1326 සිට ක්‍රි. ව. 1924 දක්වා ය.
(5) ක්‍රි. ව. 1526 සිට ක්‍රි. ව. 1857 දක්වා ය.

**8.** 'ඉලංගයි සෝනහර් වරලාරු විමර්ශනයක්' නම් ග්‍රන්ථයේ කර්තෘ
(1) ආචාර්ය, එම්. ඒ. එම්. සුක්රි ය.
(2) එම්. එම්. එම්. මහරූෆ් ය.
(3) ඒ. එම්. ඒ. අසීස් ය.
(4) අයි. එල්. එම්. ඒ. අසීස් ය.
(5) එම්. සී. සිද්දි ලෙබ්බෙ ය.

**9.** අල්-කුර්ආනයට ආසන්නතම ප්‍රබල සාධකය වන්නේ
(1) මුතවාතිර් වර්ගයේ හදීස් ය.
(2) අල්-හදීස්-අල්-කුද්සි ය.
(3) අස්-සහීහ් ය.
(4) මුත්තෆකුන් අලයිහි ය.
(5) අල්-මශ්හූර් ය.



Department of Examinations, Sri Lanka

**10.** 'ඉජ්තිහාද්' යන්නෙහි කෙටි අදහස වනුයේ,

(1) එය නීති මූලාශ්‍රයක් යන්න ය.
(2) විසඳුමක් ලබා ගැනීමට ගන්නා වෑයමකි.
(3) මුජ්තහිද්වරුන්ගේ සංවිධානය ය.
(4) ආගමික කටයුතුවල දී විද්වතුන්ගේ ස්ථාවරය ය.
(5) මුස්ලිම් සමාජයේ ඇති වන ආගම සම්බන්ධ කටයුතු ය.

**11.** ශ්‍රී ලංකා අමාත්‍ය මණ්ඩලයක විදේශ කටයුතු භාර අමාත්‍යවරයකු ලෙස සේවය කළ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා,

(1) ඒ. සී. එස්. හමීඩ් මහතා ය.
(2) ආචාර්ය, ටී. බී. ජයා මහතා ය.
(3) එම්. එච්. එම්. අෂ්රෆ් මහතා ය.
(4) ආචාර්ය, බද්යුද්දීන් මහ්මූද් මහතා ය.
(5) දොස්තර, එම්. සී. එම්. කලීල් මහතා ය.

**12.** පහත සඳහන් ප්‍රකාශ සලකන්න.

A - ඉජ්මාඋල් අක්සරිය්යා යනු අනුමත ඉජ්මා ය.
B - රුධිර සංසරණය ගැන වෛද්‍ය ඉබ්නු නෆීස් අදහස් දක්වා ඇත.
C - කෝයා ජාන් කොළඹ වරායේ ප්‍රබල මුස්ලිම් නායකයෙකි.
D - තව්හීද්, විශ්වාසය හා සම්බන්ධ සහ ක්‍රියා හා සම්බන්ධ යනුවෙන් වර්ග කර ඇත.
E - ලෞකික ජීවිතය හා එහි ඉලක්ක වටහා ගැනීමට විශ්වය පිළිබඳ දැනුම අවශ්‍ය වේ.
F - කන්දක් යුද්ධයේ දී හබ්බාබ් බින් මුන්සීර් (රළි) තුමාගේ නිපුණත්වය නබි (සල්) තුමා පිළිගත්තේ ය.

මෙයින් **වැරදි** ප්‍රකාශ වනුයේ,

(1) A හා B ය. (2) B හා C ය. (3) B හා E ය. (4) C හා F ය. (5) D හා E ය.

**13.** ඉමාම් රෂීද් රිලා (රහ්) ගේ දායකත්වයෙන් සැකසුණු අල්-කුර්ආන් විවරණය වනුයේ,

(1) තෆ්සීර් ඉබ්නු කසීර් ය.
(2) තෆ්සීර් ෆී ලීලාලිල් කුර්ආන් ය.
(3) තෆ්සීර් අල්-මනාර් ය.
(4) තෆ්සීර් තෆ්හීමුල් කුර්ආන් ය.
(5) තෆ්සීර් අත්තබරී ය.

**14.** ඉස්ලාමීය ඉතිහාසයේ බයිසාන්තිවරුන් යැයි හඳුන්වනු ලැබූයේ,

(1) පර්සියානුවන් ය.
(2) රෝමවරුන් ය.
(3) ඊජිප්තුවරුන් ය.
(4) යමානිවරුන් ය.
(5) අරාබිවරුන් ය.

**15.** 'හදීස් කුද්සි' යනු,

(1) මුතවාතිර් වර්ගයේ හදීස් ය.
(2) අල්ලාහ් පැවසුවේ යැයි නබිතුමා විසින් සඳහන් කරන ලද හදීස් ය.
(3) නබිතුමාගේ ගුණාංග හා හැඩරුව ගැන හඟවන හදීස් ය.
(4) ඉබාදා සමග පමණක් සම්බන්ධ හදීස් ය.
(5) ඉස්නාද් හා මතන් යන දෙක ම නිවැරදි වූ හදීස් ය.

**16.** පහත දැක්වෙන්නේ මුඃතසිලා සහ අෂ්අරිය්යා යන චින්තන කණ්ඩායම්වල අදහස් සමහරකි.

A - අල්-කුර්ආන් මවන ලද්දකි.
B - බුද්ධියට වඩා වහීවලට මුල් තැන දිය යුතු ය.
C - පව් කළ අයට පරලොවෙහි දී ෂෆාඅත් හිමි නොවේ.
D - යහගැත්තෝ කියාමා දිනයේ දී අල්ලාහුතආලා සැබෑ ඇසින් දකිති.
E - මහා පව් කළ අයට අල්ලාහ්ගේ අභිමතය පරිදි සමාව හෝ දඬුවම් හෝ ලැබෙනු ඇත.
F - පව් කළ අය මුඃමින් හෝ කාෆිර් හෝ නොවේ. ඔහු ෆාසික් යැයි හැඳින්විය යුතු ය.

මේවායින් අෂ්අරිය්යාවරුන්ගේ අදහස් දක්වනුයේ,

(1) A, C හා D ය.
(2) A, C හා F ය.
(3) B, C හා E ය.
(4) B, D හා E ය.
(5) C, D හා E ය.

**17.** මෝගල් පාලකයා වූ ඖරංගසීබ්ගේ කාලයේ ගොනු කළ ඉස්ලාමීය නීති ග්‍රන්ථය

(1) මජල්ලතුල් අහ්කාමිල් අද්ලිය්යා ය.
(2) ෆතාවා ඉබ්නු තයිමියා ය.
(3) අල්-මජ්මූඃ ය.
(4) අහ්ලාමුල් මුවක්කිඊන් ය.
(5) ෆතාවා ආලම්කීරි ය.

**18.** කලීෆා අබූබක්ර් (රළි) තුමාගේ කාලයේ තමන් නබී යැයි හඬ නැගූ අයගෙන් තමීම් ගෝත්‍රයේ පුද්ගලයා

(1) මුසයිලමා ය.
(2) සජාහ් ය.
(3) තුලයිහා ය.
(4) අස්වද් අන්සි ය.
(5) මාලික් බින් නුවයිරා ය.

**19.** ටී. බී. ජයා මහතාට ආචාර්ය සම්මාන ලබා දුන් විශ්ව විද්‍යාලය වනුයේ,

(1) කොළඹ විශ්ව විද්‍යාලයයි.
(2) අලිගාර් විශ්ව විද්‍යාලයයි.
(3) කරච්චි විශ්ව විද්‍යාලයයි.
(4) කේම්බ්‍රිජ් විශ්ව විද්‍යාලයයි.
(5) චිතගොං විශ්ව විද්‍යාලයයි.

**20.** වෘත්තාකාර හැඩය ද පිල්ලම් ද තිත් ද සහිත අක්ෂර ආකාරය

(1) රිකා ය. (2) නස්කු ය. (3) මුහක්කික් ය. (4) රයිහාන් ය. (5) කුෆි ය.

[ තුන්වැනි පිටුව බලන්න.

Department of Examinations, Sri Lanka

● අංක **21** සිට **25** දක්වා එක් එක් ප්‍රශ්නයට අදාළ ව යෙදුම් දෙක බැගින් දී ඇත. එම යෙදුම්වලට වඩාත් ගැළපෙන සම්බන්ධතාව දැක්වෙන පිළිතුරට අදාළ **අංකය** පහත වගුව අනුව අංක (1), (2), (3), (4), (5) අතුරෙන් තෝරන්න.

| අංකය | පළමු ප්‍රකාශය | දෙවන ප්‍රකාශය |
|---|---|---|
| (1) | නිවැරදි ය. | නිවැරදි ය. |
| (2) | නිවැරදි ය. | වැරදි ය. |
| (3) | වැරදි ය. | වැරදි ය. |
| (4) | වැරදි ය. | නිවැරදි ය. |
| (5) | නිවැරදි ය. | පළමු ප්‍රකාශය මැනවින් පහදා දෙයි. |

| | පළමු ප්‍රකාශය | දෙවන ප්‍රකාශය |
|---|---|---|
| **21.** | ආණ්ඩුකාර හජ්ජාජ් බින් යූසුෆ්ගේ තාඩන පීඩනවලට බියෙන් සමහර හාෂිමීවරුන් ශ්‍රී ලංකාවේ පදිංචි වූ බව ඇලෙක්සැන්ඩර් ජොන්ස්ටන් පවසයි. | සියලු මස්හබ් ඉජ්තිහාදය අනුමත කර තිබීම ඉජ්තිහාද් අනුමත එකක් යන්නට ඉජ්මාහ් වන සාධකයක් ලෙස පෙන්විය හැකි ය. |
| **22.** | ඉස්ලාමීය රාජ්‍යයේ තිම්මිවරුන්ගෙන් අය කළ පුද්ගල බද්ද 'කරාජ්' නම් වේ. | සබිඉය්යා, කයිසානිය්යා වැනි ඒවා ෂීආවරුන්ගේ මධ්‍යස්ථ කණ්ඩායම් කිහිපයකි. |
| **23.** | නූර්දීන් අහමද් අෂ්ෂාදුලි ඇල්ජීරියාවේ ෂාදුලිය්යා තරීක්කාව ආරම්භ කළේ ය. | අසාධාරණ පාලකයන්ට විරුද්ධව සටන් කිරීම යුතුකමක් බව කාරිජ්වරු පවසති. |
| **24.** | ඉමාම් ෂමක්ෂරිගේ 'තෆ්සීරුල් කෂ්ෂාෆ්' දර්ශන සිතුවිලි ඉදිරිපත් කරමින් ලියන ලද්දකි. | ජාති, භාෂා, ප්‍රදේශ හා ගෝත්‍රික වාද ද මෞලූඋ වූ හදීස් බිහි වීමට හේතු විය. |
| **25.** | මධ්‍යම යුගයේ ආරම්භයේ දී අරාබිවරුන් මෙන් අන් කිසිවකු මිනිස් දියුණුවට දායක නොවුණු බව ආචාර්ය පිලිප් කේ. හිටි පවසයි. | ක්‍රි. ව. 1099 දී කුරුස භටයින් ජෙරුසලම ජයගත් අවස්ථාවේ එහි පැමිණි රෙමෝන්ඩ් නම් සෙන්පතියා මිනී ගොඩවල් හරහා ගොස් මස්ජිදුල් අක්ෂාව නිරීක්ෂණය කිරීම ඓතිහාසික සත්‍යයකි. |

**26.** කලීෆා උස්මාන් (රළි) තුමා 'තුන්නූරයින්' යනුවෙන් හඳුන්වනු ලැබීමට හේතුව,
(1) නබිතුමාගේ දූවරු දෙදෙනකු එක්කෙනකුගෙන් පසු එක්කෙනා වශයෙන් විවාහ කර ගැනීම ය.
(2) හබ්ෂා සහ මදීනා හිජ්රත් දෙකට ම සහභාගී වීම ය.
(3) බිහ්රු රූමා මිල දී ගෙන අල්ලාහ් වෙනුවෙන් දන් දී ජල ප්‍රශ්නය විසඳීමට උදව් කිරීම ය.
(4) අල්-කුර්ආනය තිලාවත් කිරීමේ දී එක ම ආකාරයට ඇති කිරීම ය.
(5) හුදය්බිය්යා ගිවිසුමේ දී මෙතුමා වෙනුවෙන් සහබාවරු පණ ඇති තෙක් සටන් කරන බව බෛඅත් කිරීම ය.

**27.** 'හුජ්ජතුල්ලාහ් අල්-බාලිඅා' නම් ග්‍රන්ථයේ කර්තෘ,
(1) ඉමාම් ගස්සාලි (රහ්) ය.
(2) ඉමාම් ෂාහ්වලියුල්ලාහ් (රහ්) ය.
(3) ඉමාම් මුහම්මදු අබ්දුහු (රහ්) ය.
(4) ඉමාම් ෂුහ්රි (රහ්) ය.
(5) ඉමාම් සිර්හින්ද් (රහ්) ය.

**28.** "අල්ලාහ්ගේ නාමයෙන් දිවුරුම් දී ප්‍රකාශ කරමි. කඳුවලින් එකක් ඈත් කරන ලෙස පැවසුවේ නම්, එය අල්-කුර්ආනය රැස්කිරීමට වඩා පහසු දෙයක් වනු ඇත." යයි පැවසුවේ
(1) උමර් (රළි) ය.
(2) හුදයිෆතුල් යමානි (රළි) ය.
(3) අබුබක්ර් (රළි) ය.
(4) අබූ හුසයිමා අල්-අන්සාරි (රළි) ය.
(5) සයිද් බින් සාබිත් (රළි) ය.

**29.** ඉමාම් අබූ යූසුෆ් (රහ්) ගේ ගුරුවරයා වූයේ,
(1) ඉමාම් අබූ හනීෆා (රහ්) ය.
(2) ඉමාම් මාලික් (රහ්) ය.
(3) ඉමාම් ෂාෆිඊ (රහ්) ය.
(4) ඉමාම් අහ්මද් (රහ්) ය.
(5) ඉමාම් අබූ දාවුද් (රහ්) ය.

**30.** සුරාකා බින් මාලික් හඳුන්වා දීමට වඩාත් සුදුසු සිද්ධිය
(1) කලීෆා යසීද්ගේ කාලයේ කොන්ස්තන්තිනෝපලය ආක්‍රමණයට සහභාගී වීම ය.
(2) නබිතුමාගේ අභාවයෙන් පසුව සකීෆතු බනී ෂර්දාහි අදහස් හුවමාරු කර ගැනීම ය.
(3) කලීෆා උස්මාන් (රළි) කාලයේ ඇති වූ නොසන්සුන් තත්ත්වයට නායකත්වය දීම ය.
(4) නබිතුමා මදීනාවට හිජ්රත් ගිය අවස්ථාවේ කුරයිෂිවරුන්ගෙන් ත්‍යාග ලබා ගැනීමේ අරමුණින් නබිතුමා අල්ලා ගැනීමට ගොස් කාන්තාරයේ දී පෙරළීම ය.
(5) කන්දක් යුද්ධයේ දී සතුරන් අතරට ගොස් ඔවුනතර අවිශ්වාසය ඇති කිරීම ය.

Department of Examinations, Sri Lanka
Department of Examinations, Sri Lanka

**31.** පහත ලැයිස්තුවේ **X** තීරුව යටතේ ග්‍රන්ථ කිහිපයක නම් ද **Y** තීරුව යටතේ ඒවායෙහි කර්තෘවරුන්ගේ නම් ද **අපිළිවෙළින්** දැක්වේ.

| X | Y |
|---|---|
| (i) කිතාබුල් හින්ද් | A – අබූරිහාන් බීරූනි |
| (ii) කිතාබුත් තස්රීෆ් | B – ඉස්හාක් බින් යසාර් |
| (iii) පුතුහුල් බුල්දාන් | C – ඉබ්නු කල්දූන් |
| (iv) කිතාබුල් මකාසි | D – අස්සහ්රාවි |
| (v) අල්-මුකද්දිමා | E – අල්-බලාදූරි |

ඉහත **X** යටතේ සඳහන් ග්‍රන්ථවල අනුපිළිවෙළට අනුව **Y** යටතේ සඳහන් කර්තෘවරුන්ගේ නම් පෙළගැස්වූ විට ලැබෙන නිවැරදි පිළිතුර ඇතුළත් වරණය තෝරන්න.
(1) ACBDE (2) ADEBC (3) BADEC (4) BCAED (5) CBEAD

**32.** 'මුස්ලිම් ගාඩියන්' නම් පුවත්පත පළ කළේ,
(1) අයි. එල්. එම්. ඒ. අසීස් මහතා ය. (2) ආචාර්ය ටී. බී. ජයා මහතා ය.
(3) එම්. සී. අබ්දුර් රහ්මාන් මහතා ය. (4) සර් රාසික් ෆරීඩ් මහතා ය.
(5) එම්. එච්. එම්. අෂ්රෆ් මහතා ය.

**33.** 'දීනේ ඉලාහි' යන සංකල්පය ඉදිරිපත් කළ මෝගල් රජතුමා,
(1) බාබර් ය. (2) අක්බර් ය. (3) ෂාජහාන් ය. (4) හුමායූන් ය. (5) ජහාංගීර් ය.

**34.** පහත සඳහන් ඒවායින් **වැරදි** ප්‍රකාශය කුමක් ද?
(1) ඉස්ලාමීය ශිෂ්ටාචාරය තව්හීද්, රිසාලත් හා මආද් යන කුලුනු තුන මත ගොඩනැගී ඇත.
(2) ප්‍රශ්නයට පිළිතුරු දෙකක් වූයේ නම්, එයින් පහසු විසඳුම තේරීම නබිතුමාගේ පිළිවෙත විය.
(3) 'මුඃමින්වරයකුගේ දින දෙකක් එක සමාන නොවිය යුතු ය' යන්න හදීසයකි.
(4) ඉස්ලාමීය අකීදාව ආරක්ෂා කිරීම සඳහා ඉමාම් අහමද් බින් හන්බල් ගත් වෑයම සාර්ථක විය.
(5) නබිතුමාගේ මිඃරාජ් සිද්ධිය ප්‍රථමයෙන් පිළිගත් කාන්තාව අයිෂා (රළි) තුමියයි.

**35.** 'බසරා මස්ජිද්' හි ගුරුවරයා හා ශිෂ්‍යයකු අතර හටගත් මතභේද නිසා බිහි වූ චින්තනය
(1) අල්-අෂ්අරිය්යා ය. (2) අල්-මුර්ජිආ ය. (3) අල්-මුඃතසිලා ය.
(4) අෂ්-ෂීආ ය. (5) අල්-ජබරිය්යා ය.

**36.** මාප්පිල්ලයි ලෙබ්බෙ ආලිම් විසින් පිහිටුවන ලද අරාබි විදුහල
(1) මක්කිය්යා මද්රසා ය. (2) බාරි මද්රසා ය.
(3) කාසිමිය්යා මද්රසා ය. (4) අල්-බහ්ජතුල් ඉබ්‍රාහිමිය්යා ය.
(5) අල්-මින්නතුල් පාසිය්යා ය.

- පහත සඳහන් වන්නේ ඉස්ලාමීය දේශපාලන ඉතිහාසයේ සුප්‍රසිද්ධ පෞරුෂ හිමි කිහිප දෙනෙකුගේ නම් ය. ඒ ඇසුරෙන් **37** සිට **41** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A - මුඉස්සුත් තව්ලා | B - ජහූෆර් අල්-මන්සූර්
C - රුක්නුත් තව්ලා | D - අබ්දුල් මලික් බින් මර්වාන්
E - ඉමාදු දීන් සංගි | F - අල්-මුඃතහ්සිම්
G - නූරුදීන් සංගි | H - හාරූන් රෂීද්

**37.** මක්කාවේ පාලන බලය ලබා ගෙන සිටි අබ්දුල්ලාහ් බින් සුබයිර් පරාජය කොට ජය ගත් පාලකයා,
(1) B ය. (2) C ය. (3) D ය. (4) F ය. (5) H ය.

**38.** මහ්දිය්යා, රෆීකා යන නගර නිර්මාණය කළ අය
(1) A ය. (2) B ය. (3) D ය. (4) F ය. (5) H ය.

**39.** 'දාරුල් අද්ල්' නම් අධිකරණය පිහිටවූයේ,
(1) A ය. (2) C ය. (3) D ය. (4) E ය. (5) G ය.

**40.** මොංගෝලියානුවන් අබ්බාසීය රාජ්‍යය ජය ගත් අවස්ථාවේ එහි සිටි කලීෆාවරයා,
(1) A ය. (2) C ය. (3) D ය. (4) E ය. (5) F ය.

**41.** අබ්බාසීය කලීෆා වෙතින් 'අමීරුල් උමරා' යන පදවිය ලැබූ අය,
(1) A ය. (2) C ය. (3) E ය. (4) F ය. (5) H ය.

Department of Examinations, Sri Lanka

**42.** පහත දැක්වෙන්නේ තෆ්සීර් සම්බන්ධයෙන් වූ නිවැරදි හා වැරදි ප්‍රකාශ කිහිපයකි.

A - තෆ්සීර් බිර් රඃයි, තෆ්සීර් බිල් අස්ර් යන දෙක ම සමාන අදහස් ඇති ඒවා ය.
B - තෆ්සීර් බිර් රඃයි, තෆ්සීර් බිද්දිරායා ලෙස ද හඳුන්වයි.
C - තෆ්සීර් බිල් අස්ර් ප්‍රථමයෙන් බිහි වූ තෆ්සීර් වර්ගයයි.
D - තෆ්සීර් බිද්දිරායා තහනම් කළ තෆ්සීර් වර්ගයට අයත් ය.
E - තෆ්සීර් ඉබ්නු කසීර්, තෆ්සීර් බිල් අස්ර්වලට උදාහරණයක් වේ.

මෙයින් **වැරදි** ප්‍රකාශ වන්නේ,

(1) A, B හා D ය. (2) A, D හා E ය. (3) B, C හා D ය. (4) B, C හා E ය. (5) B, D හා E ය.

**43.** 'මල්ෆූලාත්' නම් ග්‍රන්ථය නියෝජනය කරන සමකාලීන දෑවා සංවිධානය

(1) ජමාඅතේ ඉස්ලාමි ය. (2) අන්සාර් සුන්නතුල්-මුහම්මදිය්යා ය.
(3) ජමාඅතුත් තබ්ලීග් ය. (4) රිසාලේ නූර් ය.
(5) ඉග්වානුල් මුස්ලිමීන් ය.

**44.** කලීෆා උමර් (රළි) හා අලි (රළි) ඝාතනය කළ ඝාතකයන් පිළිවෙළින්

(1) බ්රක් බින් අබ්දුල්ලාහ් හා ජුබයිර් බින් මුත්ඉම් ය.
(2) උමයියා බින් හල්ෆ් හා අබු ලුඃලුඃ ය.
(3) හාරිත් බින් ආමිර් හා අබ්දුර් රහ්මාන් බින් මුල්ජිම් ය.
(4) අබු ලුඃලුඃ හා අම්රුබින් බක්ර් ය.
(5) අබු ලුඃලුඃ හා අබ්දුර් රහ්මාන් බින් මුල්ජිම් ය.

**45.** පහත නම් සඳහන් අයගෙන් උමයියා වංශයේ පාලකයා

(1) අබු ජඃෆර් අල්-මන්සූර් ය. (2) සලාහුදීන් අයියුබි ය.
(3) උමර් බින් අබ්දුල් අසීස් (රහ්) ය. (4) මුහම්මද් අල්-ෆාතිහ් ය.
(5) අල්-වාසික් බිල්ලාහ් ය.

● පහත දැක්වෙන්නේ ඉස්ලාමීය ලෝකයේ සුප්‍රසිද්ධ පාරිභාෂික වචන කිහිපයකි. ඒවා ඇසුරෙන් **46** සිට **48** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| | | |
|---|---|---|
| A - අල්-වරඋ | B - ඉල්ලත් | C - මුරාකබා |
| D - මුතෂාබිහ් | E - මස්ලහා මුර්සලා | F - තක්ලීද් |
| G - ඉක්ලාස් | H - ෆර්ළ | I - මතන් |
| J - මර්දූද් | K - ඉස්මත් | L - අර්-රජා |

**46.** ඉහත සඳහන් ඒවායින් තසව්වුෆ් හා සම්බන්ධ වචන තුන

(1) A, C හා L ය. (2) A, G හා H ය. (3) C, G හා K ය. (4) C, H හා L ය. (5) G, K හා L ය.

**47.** ඉහත සඳහන් ඒවායින් ෂිආවරුන්ගේ ප්‍රධාන සිද්ධාන්තවලින් එකක් වන්නේ,

(1) B ය. (2) C ය. (3) G ය. (4) H ය. (5) K ය.

**48.** ඉහත සඳහන් ඒවායින් කියාස් හා සම්බන්ධ වචනය

(1) B වේ. (2) D වේ. (3) F වේ. (4) G වේ. (5) H වේ.

**49.** තබූක් යුද්ධයේ දී නබිතුමා බලාපොරොත්තු වෙමින් සිටි සහබාවරු අතර යුද්ධයට සහභාගී **නොවූ** තිදෙනා කවුද?

(1) කඃබ් බින් මාලික්, උමයියා බින් හිස්න්, හිලාල් බින් උමයියා
(2) මුරරා බින් රබීඋ, සෆ්වාන් බින් උමයියා, මාලික් බින් නුවයිරා
(3) සෆ්වාන් බින් උමයියා, කඃබ් බින් මාලික්, ලඃහාක් බින් සුෆ්යාන්
(4) කයිස් බින් ආසිම්, අතී බින් හාතිම්, සියාත් බින් ලුබයිද්
(5) කඃබ් බින් මාලික්, මුරාරා බින් රබීඋ, හිලාල් බින් උමයියා

**50.** කිලාෆතයේ සාමයට බාධා පැමිණවීම හේතුවෙන් කලීෆා උස්මාන් (රළි) විසින් රටින් පිටුවහල් කරනු ලැබූ සහාබිගේ නම හා පිටමං කළ ස්ථානය දැක්වෙන පිළිතුර තෝරන්න.

(1) අබූදර් අල් කිෆාරි - රබාදා
(2) අම්ර් බින් ආස් - දූමතුල් ජන්දල්
(3) සඃද් බින් උබාදා - නහර්වාන්
(4) මුආවියා බින් අබු සුෆ්යාන් - ෂාම්
(5) ජඃෆර් බින් අබී තාලිබ් - හබෂා

* * *

Department of Examinations, Sri Lanka
Department of Examinations, Sri Lanka

Department of Examinations, Sri Lanka
Department of Examinations, Sri Lanka

AL/2017/47/S-II

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2017 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2017 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2017

| | | |
|---|---|---|
| ඉස්ලාම් ශිෂ්ටාචාරය II<br>இஸ்லாமிய நாகரிகம் II<br>Islamic Civilization II | 47 S II | *පැය තුනයි*<br>*மூன்று மணித்தியாலம்*<br>*Three hours* |

**උපදෙස්:**

※ I කොටසින් ප්‍රශ්න **දෙකක්** ද, II කොටසින් ප්‍රශ්න **තුනක්** ද තෝරාගෙන, ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

※ සෑම ප්‍රශ්නයකට ම ලකුණු **20** බැගින් හිමි වේ.

## I කොටස

**1.** (i) 'ඉජ්තිහාද් අනුමත ය' යන්න දක්වන අල්-කුර්ආන් සහ අල්-හදීස් සාක්ෂි එක බැගින් ලියන්න.

(ii) 'ඉජ්තිහාද්හි දොරටුව වසා ඇත' යන අදහස නිසා ඇති වූ ප්‍රතිවිපාක සඳහන් කරන්න.

(iii) 'අර්කානුල් කියාස්' පිළිබඳ ව පැහැදිලි කරන්න.

(iv) 'තක්ලීද්' යන්නෙන් දැක්වෙන අදහස විස්තර කරන්න.

(v) නවීන ගැටලු විසඳීම සම්බන්ධයෙන් ඉජ්තිහාද්හි දායකත්වය අගයන්න.

**2.** (i) කලීෆාවරුන් වන උමර් (රළි) හා උස්මාන් (රළි) කිලාෆතයට තෝරා ගනු ලැබූ ආකාරය කෙටියෙන් සඳහන් කරන්න.

(ii) කිලාෆතුර් රාෂිදාවේ දී ඇති වූ අධිරාජ්‍යය ව්‍යාප්ත වීම පිළිබඳ ව පහදන්න.

(iii) සිෆ්ෆීන් යුද්ධය නිසා ඇති වූ ප්‍රතිවිපාක පිළිබඳ ව විස්තර කරන්න.

(iv) කලීෆා උමර් (රළි) තුමා කිලාෆතයේ ඇති කළ ප්‍රතිසංවිධාන පිළිබඳ ව පැහැදිලි කරන්න.

(v) කලීෆා අලි (රළි) තුමාගේ පාලනය අගයන්න.

**3.** (i) ශ්‍රී ලංකාවට ඉස්ලාමය හඳුන්වා දෙනු ලැබීම පිළිබඳ ව කරුණු සාක්ෂි සහිත ව දක්වන්න.

(ii) ශ්‍රී ලාංකීය මුස්ලිම්වරුන් රට වෙනුවෙන් කළ දායකත්වය පිළිබඳ ව විස්තර කරන්න.

(iii) දකුණු ඉන්දීය සහ ශ්‍රී ලාංකීය මුස්ලිම් සම්බන්ධතාව ඇති කළ ප්‍රතිවිපාක පරීක්ෂා කරන්න.

(iv) ශ්‍රී ලාංකීය මුස්ලිම් පෞද්ගලික නීතියේ අන්තර්ගතය විස්තර කරන්න.

(v) එම්. සී. සිද්දි ලෙබ්බේ විද්වතාණන්ගේ සමාජයීය දායකත්වය අගයන්න.

## II කොටස

**4.** (i) මුස්ලිම්වරුන් වෛද්‍ය ක්ෂේත්‍රයේ නියැලීමට තුඩු දුන් කරුණු පහදා දෙන්න.

(ii) ඉතිහාස ක්ෂේත්‍රයේ වර්ධනයට මුස්ලිම්වරුන්ගේ දායකත්වය විමසන්න.

**5.** (i) උමයියා සහ අබ්බාසීය පාලන සමයේ පරිපාලන ක්ෂේත්‍රයේ දක්නට ඇති සමාන අසමානකම් විමසන්න.

(ii) කලීෆා හාරූන් රෂීද්ගේ පාලනයේ දී රටේ ඇති වූ සංවර්ධනය පිළිබඳ ව හා බාමකීවරුන් සමග එතුමාගේ සම්බන්ධතාව පිළිබඳ ව ද පැහැදිලි කරන්න.

**6.** (i) 'අකබා' සහ 'හුදයිබිය්යා' ගිවිසුම් ඉස්ලාම් ව්‍යාප්තිය කෙරෙහි ඇති කළ බලපෑම් පිළිබඳ ව පැහැදිලි කරන්න.

(ii) අන්‍ය ශිෂ්ටාචාරවල මිශ්‍ර වීම නිසා ඉස්ලාමීය ලෝකය ලැබූ **වාසි** හා **අවාසි** ගැන සාකච්ඡා කරන්න.

**7.** (i) ජාහිලිය්යා සමාජ සංවිධානයත්, ඉස්ලාමීය සමාජ සංවිධානයත් අතර පවතින වෙනස්කම් සංසන්දනය කරන්න.

(ii) ඉස්ලාමීය කිලාෆතයේ පිරිහීමට තුඩු දුන් හේතු පිළිබඳ ව විස්තර කරන්න.

**8.** (i) නබි මුහම්මද් (සල්) තුමාගේ කාලයේ හදීස් ආරක්ෂා කළ ආකාරය සාක්ෂි සහිත ව පැහැදිලි කරන්න.

(ii) ෆික්හ් ක්ෂේත්‍රයට ඉමාම් ෂාෆිඊ (රහ්) තුමාගේ දායකත්වය **හෝ** හදීස් ක්ෂේත්‍රයට ඉමාම් බුහාරි (රහ්) තුමාගේ දායකත්වය **හෝ** අගයන්න.

* * *

Department of Examinations, Sri Lanka